# අභයගිරිය හා එහි විෂයමාලාව
# [Abhayagiriya and Its Curriculum]

**W.K. Keerthirathne**[1]


## Abstract

Abhayagiri Vihara, founded during the reign of King Walagamba, became a prominent educational centre that nurtured the Mahayana tradition until the Chola invasion during the Polonnaruwa period. This research explores the curriculum of Abhayagiri Vihara, using content analysis of relevant literary sources. The findings indicate that Abhayagiri was a well-structured educational institution where local and foreign Bhikkhus, Bhikkhunis, and laypeople studied. The curriculum comprised formal, informal, and nonformal education. Formal education covered languages, poetry, religion, technology, art, history, medicine, and Gupta Vidya. Nonformal education involved practical skills like creating gold items, producing coins and tiles, and writing poetry. Assemblies and meetings were organized to encourage knowledge sharing. The Sannipatasala, a major hall in the Vihara, was used for large gatherings. Other co-curricular activities included the Perahara processions and religious worship. Abhayagiri also engaged in welfare activities, as seen in the Pinkama event, where water tanks were offered, reflecting a broader commitment to community service. The maintenance of the temple was part of a hidden curriculum that emphasized discipline, honesty, and respect. Bribery, corruption, and immoral behavior were strictly forbidden, and punishment for offenders served as a deterrent. Respect for elders and following monastic hierarchy were key aspects of informal education. The curriculum at Abhayagiri Vihara balanced academic knowledge and moral development, offering valuable lessons for modern educational systems in Sri Lanka by promoting holistic development and ethical behavior among students.


**Keywords:** Education, Formal curriculum, Informal curriculum, Nonformal Curriculum

1. Professor, Department of Humanities, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.
E-mail:keerthirathna@ssh.rjt.ac.lk https://orcid.org/0009-0004-8381-3310

Received: 5 March 2024, Accepted revised version: 20 June 2024. This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

**සාරසංක්ෂේපය**

වලගම්බා රාජ සමයෙහි ආරම්භ වූ අභයගිරිය රාජ්‍යය අනුග්‍රහය යටතේ පොලොන්නරු රාජධානියෙහි චෝල ආක්‍රමණය සිදු වන තෙක් ම මහායාන සම්ප්‍රදාය පෝෂණය කළ අධ්‍යාපන ආයතනයක් ලෙස පැවතී ඇත. අභයගිරියෙහි ක්‍රියාත්මක වූ විෂයමාලාව කෙබඳු ද යන්න විමර්ශනය කිරිම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. මෙහි දී සන්දර්භ විග්‍රහාත්මක ක්‍රමය පර්යේෂණ ක්‍රමය ලෙස තෝරාගෙන ගැනුණු අතර අභයගිරිය සම්බන්ධ ලියැ වී ඇති සාහිත්‍යාත්මක ලේඛන පර්යේෂණ තොරතුරු එක්රැස් කිරිම සඳහා භාවිත කෙරිණ. සාහිත්‍යය විමර්ශනය මඟින් ලබාගත් තොරතුරු විශ්ලේෂණාත්මක ව හා ඇගයුම්ශීලි ව ඉදිරිපත් කොට ඇත. පර්යේෂණ අනාවරණ අනුව අභයගිරිය අධ්‍යාපන ආයතනයක් ලෙස ඉතා දියුණු තත්වයක පැවති බව තහවුරු විය. අභයගිරියෙහි භික්‍ෂු, භික්‍ෂුණී, යන උභතෝ සංඝයා මෙන් ම ගිහි පිරිස් ද අධ්‍යාපනය ලබා ඇත. මෙම භික්‍ෂු, භික්‍ෂුණී පිරිස අතර විදේශීය පිරිස් ද විසූහ. විෂයමාලාව විධිමත්, අවිධිමත් හා නොවිධිමත් ලෙස ක්‍රියාත්මක වී ඇත. විධිමත් විෂයමාලාව යටතේ ක්‍රියාත්මක වූ විෂය නිර්දේශ විෂයන් ගණනාවකින් යුත්ත විණ. ඒවා භාෂා විෂයන්, කාව්‍යශාස්ත්‍ර, ආගමික විෂයන්, තාක්‍ෂණික විෂයන්, කලාත්මක විෂයන්, ගුප්ත විද්‍යාව, ඉතිහාසය, වෛද්‍යවිද්‍යාව යන ක්‍ෂේත්‍ර ඔස්සේ ලබා දී ඇත. නොවිධිමත් විෂයමාලාව යටතේ රන් භාණ්ඩ නිෂ්පාදන කලාව හා ගෘහ නිර්මාණශිල්ප, කාසි නිෂ්පාදන හා ඒවා භාවිතයට යොමු කිරීම, වහල සෙවිලි කරන උළු නිෂ්පාදනය කිරීම වැනි ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කර වූ බව දක්නට ලැබේ. මෙයට අමතර ව ගීත රචනය ද විෂය සමගාමී ක්‍රියාකාරකමක් ලෙස ප්‍රගුණ කරවා ඇත. සමිති සමාගම් හා රැස්වීම් පවත්වමින් අදහස් හා දැනුම හුවමාරු කරගත් බවත් විශාලතම සන්නිපාත ශාලාව අභයගිරිය සතු ව තිබූ බවත් පර්යේෂණ අනාවරණ මඟින් තහවුරු විය. පෙරහැර පැවැත්වීම ද දේව වන්දනයට අදාළ ක්‍රියාකාරකම් ද විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස පැවතී ඇත. කපාරාරාමයේ සිදු කළ ජල ටැංකි පූජාවෙන් තහවුරු කරන්නේ ශුභ සාධන වැඩ සඳහා සිසුන් යොමු කිරීම තවත් එක් විෂය සමගාමී ක්‍රියාකාරකමක් වූ බව ය. මේ තොරතුරු සනාථ කරන්නේ ශාස්ත්‍රීය අධ්‍යාපනය පමණක් නො ව සිසුන්ගේ කාලය අර්ථවත් ව ගෙවී යන සේ ඔවුන්ට නිමග්න විය හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් ද ඉතා සංවර්ධිත ක්‍රමයකට සකස් කොට තිබූ බව ය. අවධිමත් අධ්‍යාපනය පිළිබඳ අනාවරණය වූ තොරතුරු අනුව නිගමනය කළ හැක්කේ ආයතන පිරියත ඉතා අලංකාරවත් ව සකස් ව පැවති ඇති බව ය. අල්ලස් ගැනීම මෙහි විසූවන්ට ගෝචර වූවක් නො වී ය. බොරු කීම, රළු වචන කීම, අශාසනික පැතුම් ප්‍රගුණ කිරිම, ලෝක වීරෝධි හා ශාසන විරෝධි ක්‍රියාවල යෙදීම මොවුන් අතින් සිදු වී නැත. එයින් තහවුරු වන්නේ අභයගිරියෙහි අධ්‍යාපනය ලැබූවන් ඉතා උසස් ලෙස මෘදු කුසලතා සංවර්ධනය කරගත් අය බව ය. වරදට දඬුවම් නියම කිරීම නිසා එය දකින අන් අය වැරදි කිරීම්වලට බිය ඇති කරගන්නට ඇති බව නිගමනය කළ හැකි ය. වැඩිහිටියන්ට ගරු කිරීම හා සඟ මහලු පිළිවෙළ අනුගමනය කිරීම මෙම ආයතනවල ප්‍රගුණ කළ බව සැඟවුණු විෂයමාලාව හෙවත් අලිඛිත විෂයමාලාව මඟින් මතුවන තොරතුරු සනාථ කරයි. මෙහි අන්තර්ගත වූ විෂයමාලාව වර්තමාන අධ්‍යාපන පද්ධතියට ද සංවර්ධනය සඳහා ද සාධනීය ව භාවිත කළ හැකි බව දක්නට ලැබේ.

**ප්‍රමුඛ පද:** අවිධිමත් විෂයමාලාව, නොවිධිමත් විෂයමාලාව, විධිමත් විෂයමාලාවල අධ්‍යාපනය

## හැඳින්වීම

අභයගිරිය ලාංකේය ආධ්‍යාපනික ඉතිහාසයෙහි සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය. වළගම්බා රාජ සමයෙහි (103 BCE 89 - 77 BCE) ඉදි වූ අභයගිරි විහාරයෙහි ඉතිහාසය පණ්ඩුකාභය රජ සමය (437 - 367 BCE) දක්වා දිවෙන බව ඇතමෙකුගේ අදහස යි. එයට හේතුව පස්වන සියවසේ මෙම ස්ථානයෙහි ජෛන ආගමික මධ්‍යාස්ථානයක් පැවතීම යි. වළගම්බා රජුගෙන් පසු ව ගජබාහුකගාමිණී (114 – 136 AD), කණිටු තිස්ස (167 -186 AD) (මහාවංසය, 36, 7, 8) මහසෙන් (279 -301 AD) (මහාවංසය, 37, 10,16) පරාක්‍රමබාහු යන රජවරු අභයගිරි විහාරයෙහි දියුණුව සඳහා කටයුතු කළහ. ගජබාහුක ගාමිණී රජු ගාමිණී තිස්ස වැව නිර්මාණය කරමින් විහාරස්ථානයට අයක් ඉඩම් සංවර්ධනය කර ගැනීමට උදවු කළ බව කියයි (මහාවංසය, 35, 19-122) අභයගිරියට රත්නප්‍රාසාදය කරවා දුන්නේ කණිෂ්ඨ තිස්ස රජු ය (මහාවංසය, 35, 19-122). මහසෙන් රජු අභයගිරි විහාරය විනාශ කර එහි තිබූ සියලු ම ද්‍රව්‍යය අභයගිරිය ගොඩනැඟීමට යොදාගත් බව කියයි. වළගම්බා රාජ සමයෙහි ස්ථාපිත කළ අභයගිරි විහාරය පොලොන්නරු රාජධානි සමය දක්වා වරින් වර ලැබුණු රාජ්‍යය අනුග්‍රහය යටතේ ඉතාමත් සාර්ථක ව ක්‍රියාත්මක ව තිබේ. මෙම ලිපියෙහි අරමුණ වන්නේ එසේ සියවස් ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වූ අභයගිරියෙහි පැවති අධ්‍යාපන ක්‍රියාවලියත් එහි ක්‍රියාත්මක වූ විධිමත්, අවිධිමත් සහ නොවිධිමත් විෂය මාලාවත්, එම අධ්‍යාපන ක්‍රියාවලියේ ස්වාභාවයත්, එහි සංයුතියත් පිළිබඳ ව අධ්‍යයනය කිරීම වේ.

## සාහිත්‍ය විමර්ශනය

කිසියම් අධ්‍යාපන ආයතනයක අධ්‍යාපන ක්‍රියාවලියෙහි ගුණාත්මක බව රැක ගැනීම සඳහා මග පෙන්වීම් කරනු ලබන මූලිකත ම ලියවිල්ල විෂයමාලාව වේ (Apsari, 2018). අරමුණු කරගත් අධ්‍යාපන පරමාර්ථ කෙරෙහි ළඟාවීම සඳහා ආධ්‍යාපනික පරිසරයක දී සිසුවාගේ හා ගුරුවරයාගේ කාර්යභාරය කෙබඳු ද පාසලේ සම්පත් කුමන ආකාර විය යුතු ද යන්න තීරණය කෙරෙන, අධ්‍යාපන ආයතනයන් සතුවන ලඛිත මාර්ගෝපදේශය විෂයමාලාව බව ඇතමෙක් අදහස් කරති (Alamo, 2019). අධ්‍යාපන පරිසරයක සැකැස්ම, ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ ගුරුවරයා ගනු ලබන තීරණ, අධ්‍යාපනය පිළිබඳ සමාජ මතය ප්‍රකට කෙරෙන සමස්තය කැටි වූ ලියවිල්ල විෂයමාලාව බව තවත් අයෙක් පවසති (McLachlan, Claire, et al, 2018). අභයගිරිය ශ්‍රී ලාංකේය ආධ්‍යාපනික ඉතිහාසයෙහි සුවිශේෂි සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය. මුල් කාලයෙහි සංඝාරාමයක් ව පැවති අභයගිරිය පශ්චාත්කාලීන ව විශිෂ්ට ගණයේ අධ්‍යාපන ආයතනයක් ලෙස දියුණුවට පත් ව ඇත (මහින්ද, 2018). අභයගිරිය සඳහා උත්තර විහාර, ධම්මරුචි, ධර්මරුචි යන නම් ද භාවිත කළ බවට සාධක දක්නට ලැබේ. ටීකා සාහිත්‍යයේ අභයගිරියේ විසූවන් අභයගිරිවාසික, අභයගිරික, උත්තරවාසික, උත්තරවාසින් යන යෙදුම්වලින් හඳුන්වා ඇත. මෙයට අමතර ව ධම්මකථිකවාදී, උත්තරවිහාරීන් සහ අභයුත්තර ලෙස ද හඳුන්වා ඇත්තේ මෙම අභයගිරි විහාරයේ වැඩ විසූ භික්ෂූන් ම ය. අෂ්ටායතනවලින් වැඩි ගණනක් අයත් වූයේ අභයගිරි විහාරයට ය (එම). බද්ධාවාස යන්න ද අභයගිරිය සතු ව පැවතුණකි (Ez. vol.1,i.p.234). අභයගිරියට සම්බන්ධ ව අනු ගුරු කුල පැවති බව 'දහම්දැසි, නම් ගුරු කුලයට සම්බන්ධ තොරතුරු මඟින් සනාථ වේ. උත්තරමූලය අභයගිරියේ ප්‍රධාන අංගයක් වූ බව වේලෙක්කාර ලිපිය සඳහන් කරයි. මහනෙත් පාමුල හෙවත් මහානෙත්ත ප්‍රාසද මූලය ද අභයගිරියට අයත් වූවකි (Ez.vol. ii.p.252). අභයගිරියට අයත් වූ දක්ඛිණ මූලය පසු ව ස්වාධීන වී ඇත.

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත් වූ අභයගිරි විහාරය මහායාන සම්ප්‍රදාය පෝෂණයෙහි ලා පුරෝගාමී මෙහෙවරක් සිදු කොට ඇත (චන්ද්විමල, දිනය අප්‍රකාශිතය). එහෙත්, ඇතමෙක් පවසන්නේ අභයගිරිය ගොඩනගන ලද ආරම්භක කාලවකවානුවේ දී අභයගිරිය හා මහාවිහාරය අතර වෙනසක් නො වූ බව ය (මහාවංසය, 35, 2-57, 119-22, 36, 7,14 සහ ජයසූරිය, 2016). පශ්චාත්කාලීන ව ඉන්දියාවෙන් පැමිණි ධර්මරුචි නිකායට අයත් භික්ෂූන් මහා විහාර සම්ප්‍රදායෙන් වෙනස් වූ භාවිතයන් අභයගිරියට හඳුන්වා දී ඇත (නිකාය සංග්‍රය, 11-12). ඉන් අනතුරුව, සම්ප්‍රදායන් දෙකෙහි මතු වූ වෙනස්කම් සමඟ අභයගිරි විහාරවාසිකයන් ව ධර්මරුචි නමින් හඳුන්වා ඇත. පසු ව අභයගිරිය මහායාන සම්ප්‍රදායට අයත් ස්ථානයක් බවට පත් ව ඇත. මේ කරුණු දෙක ම අධ්‍යයනය කළ තවත් අයෙක් පවසන්නේ අභයගිරියෙහි අධ්‍යාපන ක්‍රියාවලියේ දී මහාවිහාර සම්ප්‍රදාය පමණක් නො ව වෙනත් ආගමික මූලධර්මයන් ද ඇතුළත් ව තිබූ බව ය (පද්මලාල්, දිනය අප්‍රකාශිත ය). වළගම්බා රාජ සමයෙහි ස්ථාපිත කළ අභයගිරි විහාරය පොලොන්නරු රාජධානි සමය දක්වා වරින් වර ලැබුණු රාජ්‍යය අනුග්‍රහය යටතේ ඉතාමත් සාර්ථක ව ක්‍රියාත්මක ව තිබේ.

### පර්යේෂණ ගැටලුව

විෂයමාලා සංශෝධනය අධ්‍යාපන පද්ධතිවල වරින්වර සිදුවන්නකි. මෙම විෂයමාලා සංශෝධන මඟින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නො හැකි වී තිබීම සුවිශේෂී ලක්ෂණයකි. එවැනි පසුබිමක, පැරණි බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානවලින් ගතහැකි ආදර්ශවලින් එම හිඩැස් පිරවිය නො හැකි ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ.

### පර්යේෂණ අරමුණු

- අධ්‍යාපන ආයතනයක් ලෙස අභයගිරියෙහි පැවති ස්වභාවය අධ්‍යයනය කිරීම.
- අභයගිරියෙහි ක්‍රියාත්මක වූ ත්‍රිවිධ විෂයමාලාව (විධිමත්, අවිධිමත් සහ නොවිධිමත්) මාලාව පිළිබඳ විමර්ශනය කිරීම.
- අභයගිරියෙහි ක්‍රියාත්මක වූ ත්‍රිවිධ විෂයමාලාවෙහි ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කිරීම.
- අධ්‍යාපන ආයතනයක් ලෙස අභයගිරියෙන් වර්තමාන අධ්‍යාපන පද්ධතියට ගතහැකි ආදර්ශ පිළිබඳ සොයා බැලීම.

### පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ භාවිත කළ හැකි සන්දර්භ විග්‍රහාත්මක ක්‍රමය පර්යේෂණ ක්‍රමය ලෙස තෝරාගෙන ගැනිණ. අභයගිරිය සම්බන්ධයෙන් ලියැවී ඇති පර්යේෂණ පත්‍රිකා, පර්යේෂණ කෘති, සහ වෙනත් ලිපි ලේඛන දත්ත රැස් කිරීම සඳහා භාවිත කෙරිණ. සාහිත්‍යය විමර්ශනය මඟින් ලබාගත් තොරතුරු තේමා පාදක ව විශ්ලේෂණාත්මක ව හා ඇගයුම්ශීලි ව ඉදිරිපත් කොට ඇත.

### සාකච්ඡාව

### විධිමත් විෂයමාලාව

වජ්ජිපුත්තක නිකායට අයත් පොතපත අභයගිරි විහාරයේ විධිමත් විෂයමාලාවේ ප්‍රමුඛ කොටසක් වී තිබුණි. මෙයට හේතුව, වජ්ජිපුත්තක නිකායට අයත් ධර්මරුචි හිමියන් විශාල අනුගාමික පිරිසක් සමඟ මෙරටට පැමිණ වැඩ සිටිම යි. මහායාන ධර්මය පිළිගත් මෙකී වජ්ජිපුත්තක භික්ෂූහු වෛතුල්‍යවාදය ව්‍යාප්ත කිරීමෙහි

ද යෙදී සිටියහ. වජ්ජිපුත්තක හා වෛතුල්‍යවාදය යන දර්ශනවාද දෙක අභයගිරි විහාරයෙහි විධිමත් විෂයමාලාවට ඇතුළත්වීමට හේතු වී ඇත්තේ අභයගිරිය දකුණු ඉන්දියාවේ පල්ලවාරාමය හා පැවැත් වූ සම්බන්ධතාවන් ය (මහින්ද, 2018). වජ්ජිපුත්තකයන් අයත් වූයේ පල්ලවාරාමයට ය. ඒ අනුව අභයගිරිය මහායානයේ කේන්ද්‍රස්ථානය බවට පත් විය. අභයගිරි විහාරිකයන් දකුණු ඉන්දියාවේ පල්ලවාරාමය සමග පැවැත් වූ සබඳතා නිසා ශාසනික වශයෙන් පිරිහීමක් ඇති කළත් ශාස්ත්‍රීය වශයෙන් දියුණුවක් ඇතිවීමට දායක වී ඇත.

මහායාන ධර්මයෙහි බලපෑම නිසා සංස්කෘත භාෂාව සඳහා අභයගිරි විෂය නිර්දේශයෙහි වැදගත් තැනක් හිමි ව ඇත. සංස්කෘත භාෂාව එහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී උපදෙස් සපයන ලද ප්‍රධාන භාෂාව බවට පත් ව තිබුණි. ඒ අනුව, අභයගිරි විෂයමාලාවෙහි සිංහල භාෂාවට හා පාළි භාෂාවට ලැබුණේ අඩු ප්‍රමුඛතාවකි. සංස්කෘත භාෂාව ප්‍රධාන භාෂා මාධ්‍යය බවට පත්වෙත් ම ලෞකික විෂයන් රාශියක් එහි විෂය නිර්දේශයට ඇතුළත් වූ බව පෙනේ. කාව්‍යය නාටක ශාස්ත්‍ර, ගීත නිර්මාණය, නීති, විද්‍යා, දේශපාලනය, ඡන්දස්, අලංකාර, ජ්‍යෝතිෂ, ආයුර්වේද, ගණිතය, තර්ක ශාස්ත්‍රය, තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපනය න්‍යාය, වාස්තු විද්‍යාව මෙහි ඉගැන්වූ විෂයන් වේ (CHT: Vol.1.i.p.26,27). සංස්කෘත භාෂාවේ බලපෑම නිසා අභයගිරි විෂය නිර්දේශයෙහි ආගමෙන් පිටස්තර විෂයන් ද උගන්වා ඇත.

මහායානයට අයත් කෘති රචනා කරමින් මහායානය පෝෂණය කළ ග්‍රන්ථ කතුවරුන් වන නාගාර්ජුන, අසංග, ධර්මකීර්ති, ශාන්තිදේව, වසුබන්ධු, දින්නාග හා අශ්වඝෝෂ යන අය පිළිබඳ අධ්‍යයනය කිරීම ද ඔවුන් රචනා කළ පොත පත අධ්‍යනය කිරීම ද අභයගිරියෙහි ක්‍රියාත්මක වූ විෂය නිර්දේශවල ප්‍රධාන විෂයක් ව පැවති බව ද සිතිය හැකි ය.

අභයගිරිය සාම්ප්‍රදායිකත්වයෙන් ඔබ්බට ගිය අධ්‍යාපන ආයතනයකි. මෙහි විසූ ගුරු සිසු දෙපිරිස ම විචාර පූර්වක අය වූහ. මෙම ගුරු-සිසු දෙපිරිසට ගිහි පැවිදි දෙපාර්ශ්වයේ ම අය අයත් වූහ. ඒ අනුව මිනිසාගේ ජීවන අවශ්‍යතා සලකා බලා නව විෂය නිර්දේශ ක්‍රියාත්මක වූ අභයගිරිය විචාර පූර්වක සිසු පිරිසක් බිහි කළ ආයතනයක් වීම සුවිශේෂී ලක්ෂණයක් වූ බව නිරීක්ෂණය වේ. ෆාහියන්ගේ වාර්තාවල දැක්වෙන්නේ වෙනත් බෞද්ධ රටවල දුර්ලබ වශයෙන් දක්නට ලැබුණු බෞද්ධ පොත පත අභයගිරියෙහි බහුල ව තිබූ බව ය. හියුංසෑං ගේ වාර්තාවල දැක්වෙන්නේ අභයගිරියේ මහායාන හා හීනයාන යන සම්ප්‍රදායන් දෙක ම ඉගැන් වූ බව ය (හියුංසෑං, භ්‍රමණ වෘත්තාන්තය). මෙසේ මහායාන හා හීනයාන යන සම්ප්‍රදායන් දෙක ම අභයගිරියෙහි විෂයමාලාවට ඇතුළත් වීමට බල පෑ හේතුවක් වූයේ මහාවිහාරයට රාජ්‍යය අනුග්‍රහය නොලැබීම නිසා මහාවිහාරයට අයත් වූ සඳගිරිය වැනි විහාර අභයගිරියෙහි පාලනයට නතු වීම යි. අභයගිරිකයෝ මහාවිහාරයට අනුබද්ධ ව පැවති සඳගිරිය වාසස්ථාන කොට විසූ බව සඳහන් වේ (මහාවංසය, 38:75,76).

වළගම්බා රාජ සමයෙහි දී අභයගිරි විහාරයෙහි මූලික කාර්ය වූයේ ශාසනයේ පැවැත්මට මූල පර්යාප්තිය යැයි සලකමින් එය වඩාත් මතු කොට දැක්වීම යි. ධර්මය ඉගෙන ගැනීම මෙහි මූලික ම ලක්ෂණය වූ හෙයින් නිර්දිෂ්ට ග්‍රන්ථ රාශියක් විෂය නිර්දේශවල අන්තර්ගත ව පැවතිණි.

මෙයට අමතර ව ධර්මය හා විනය දෙක ද අභයගිරි විෂය නිර්දේශයේ අඩංගු ව පැවති අතර ඒවා ථේරවාදයට වඩා සියුම් වෙනස්කම් සහිත ව උගන්වා

ඇත. මහාවිහාරිකයන් උප්පාද, ඨිති, භංග යනුවෙන් සිතෙහි පවතින අවස්ථා තුනක් ඇති බව පිළිගත්ත ද අභයගිරිකයෝ ඨිති අවස්ථාව නො පිළිගත්හ. සමන්තපාසාදිකාව දක්වන අකාරයට විනය සම්බන්ධයෙන් ද අභයගිරිකයන් හා මහා විහාරිකයන් අතර එකිනෙකට වෙනස් මතවාද පැවතී ඇත. හියුං සෑං පවසන්නේ මහාවිහාර භික්ෂූන් හීනයානය පමණක් ඉගැන්වූ බව ය. අභයගිරිකයෝ හීනයාන හා මහායාන යන දර්ශන දෙක ම ඉගැන්වූහ. නිකාය සංග්‍රයයට අනුව වළගම්බා රාජ්‍ය සමයෙහි දී ද අභයගිරිකයෝ වජ්ජී පුත්තක නිකායික ධර්මය ඉගෙන ගත්හ (නිකාය සංග්‍රහය, 2008). වෝහාරික රාජ්‍යය සමයෙහි දී අභයගිරිකයෝ වෛතුල්‍යයවාදය හදාරා තිබේ (මහාවංසය, 36:41). එවැනි ව ම මෙම රාජ්‍ය සමයේ දී වෛතුල්‍යයවාදය පිරිසිදු බුදු දහම බව පෙන්වීමට ද උත්සුක ව ඇත. මහාවිහාරිකයන් මෙම මතය මිථ්‍යාවක් බව පවසා ඇත. වෝහාරික තිස්ස රජු මේ පිළිබඳ ව කපිල ඇමති ලවා විභාග කරවා වෛතුල්‍යයවාදයට අයත් පිටකය පුළුස්සා එම ධර්මය ඇදහූ භික්ෂූන්ට දඬුවම් කරවා රටින් පිටුහල් කිරීමට කටයුතු කළේය (මහාවංසය, 36:78). කණිෂ්ක රජුගේ කාලයේ සිදු වූ ධර්මසංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස වෛතුල්‍යයවාදය ලංකාවට පැමිණ ඇත. මත්වලසෙන් රාජ සමයෙහි දී අභයගිරිකයෝ වජ්‍රයානය උගත්හ. පළමුවැනි සේන රජුගේ කාලයේ දී දඹදිව වජ්ජිපුත්තක නිකායිකයෝ අභයගිරියෙහි වීරංකුරාරාමයෙහි වාසය කරමින් වාජිරිවාදය ප්‍රචාරය කළහ. එවැනි ව ම අභයගිරිකයෝ තම විෂයමාලාවල ඛන්ධක පරිවාර අර්ථාන්තර වශයෙන් ද පාඨාන්තර වශයෙන් ද වෙනස් කොට ඉගැන්වූහ (එම).

අභයගිරික භික්ෂූහු වෛදික සංස්කෘත හදාරා ඊට අයත් වේද, වේදාන්ත, විෂයන් පුළුල් ලෙස ගැඹුරින් අධ්‍යයනය කළහ. කෙසේ වුවත්, මහායානිකයන්ට ද සම්පූර්ණයෙන් ම හීනයාන අදහස්වලින් වියුක්ත ව හා ඒවා ඉගෙන නොගෙන බැහැර කරලීමට නොහැකි වූ බව සිතිමට ද සාධක තිබේ. මිහින්තලා, මැදිරිගිරිය, බුදුරුවගල කුෂ්ටරාජගල වැනි ස්ථානවල මෙම අදහස සනාථ කිරීමට ප්‍රමාණවත් උදාහරණ පවතියි (අධිකාරි, 1991).

චිත්‍ර කලාව අභයගිරිය විෂය නිර්දේශයෙහි තවත් එක් විෂයයක් ව පැවති බවට උදාහරණ කුලතුංග (1986) ඉදිරිපත් කරයි. ඔහුට අනුව, එහි වර්ණරසායනාගාරයක් තිබී ඇත. වර්ණ සංයෝජනය සමඟ යොදාගත් දේශීය හා විදේශීය අමු ද්‍රව්‍ය ඒ අසලින් සොයාගෙන ඇත. චිත්‍ර කලාවට අමතර ව තාක්ෂණික විෂයන් කෙරෙහි ද නැඹුරු වූ අධ්‍යාපන වටපිටාවක් අභයගිරියෙහි තිබූ බවට සාක්ෂ්‍ය හමු වේ. අභයගිරියෙහි ලෝකුරු කැටයම් පිළිබඳ ව ඉගැන්වූ බවට ඇතමෙක් සාක්ෂ්‍ය ඉදිරිපත් කරති (හෙට්ටි ආරච්චි, 1992). මෙම ස්ථානයෙන් හමු වී ඇති පාත්‍රයෙහි අෂ්ට මංගල ලක්ෂණ අර්ධෝන්නත ව කැටයම් කර තිබූ බව පැවසීමෙන් එකල කැටයම් කලාව ද විෂයක් හැටියට උගන්වා ඇති බව තහවුරු කරයි (එම). මෙම ස්ථානයෙන් හමු ව ඇති කෝච, උඳුන්, රන්ගුලි, කාසි, අච්චු මේ බව තව දුරටත් තහවුරු කරයි. මෙහි අෂ්ට මංගල යනු භද්‍රපීඨ, මත්ස්‍යයුග, අංකුස, චාමර, ශ්‍රීවත්ස, පූර්ණඝට, සංඛ හා ස්වස්තික වේ.

අභයගිරි සංස්කෘත ශිලා ලිපියට අනුව, චාතුර්මහා නිකායික භික්ෂූන් විසිපහ (25) බැගින් සියක් නමක් (100) අභයගිරියෙහි අධ්‍යාපන කටයුතුවල යෙදුණු බව සඳහන් වේ. මෙහි චාතුර් නිකාය යනු සර්වාස්ති, මහාසාංඝික, සම්මිතීය සහ ස්ථවිරවාදීන් ය (වික්‍රමසිංහ, 2004). ඒ ඒ නිකායන්ට අයත් ඉගැන්වීම් තුලනාත්මක ව අධ්‍යයනය කිරීමට අවස්ථාව ලැබී ඇති හෙයින් තුලනාත්මක අධ්‍යාපනය අභයගිරි විහාරයෙහි තවත් එක් විෂයක් වූ බව නිගමනය කළ හැකි

ය. අභයගිරියෙහි භික්ෂූන් පන්දහක් (5000) ක් විසූ බව ෆාහියන්ගේ මතය යි. අභයගිරිය දාන ශාලාවේ තිබෙන මීටර් දහනවයක් (19) දිගැති ගල් ඔරුව පාත්‍ර 5000 ක් පමණ පිරවිය හැකි ධාරිතාවකින් යුක්ත වූ බව පැවසේ (හෙට්ටි ආරච්චි සහ කුලතුංග, 1996).

පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි ලිපියෙහි එතුමා අභිධර්මය රන්පත්වල ලියා ආචාර්යවරයා හමුවේ විස්තර කළ බවත් බුදු ගුණ සිංහලෙන් වර්ණා කළ බවත් සඳහන් කර ඇත (වික්‍රමසිංහ, 2004). කිසියම් අයෙකු පැවිදි දිවියට පත්වන්නේ නම් සතර බණවර පිළිබඳ දැනුම වර්ධනය කරගත යුතු ව තිබුණි. එසේ ලබාගත් දැනුම මාස තුනකින් පරීක්ෂාවට ලක් කරන ලද බව කියැවේ (පරණවිතාන, 1928). මෙමගින් පෙනෙන්නේ නිශ්චිත අධ්‍යාපන කාලසීමාවක් ද සහිත ව සිසුන් අධ්‍යාපන කටයුතුවල යෙදී ඇති බව ය. අභයගිරියේ භික්ෂූන් වහන්සේ පමණක් නො ව ගිහියන් ද අධ්‍යාපනය ලැබූ බව මේ තොරතුරු මඟින් අනාවරණය වේ. පැවිදි දිවියට යොමු කිරීමේ දී අඩු වයස් දරුවන් ඒ සඳහා යොමු නොකළ යුතු බව පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි සෙල්ලිපියේ දක්නට ලැබෙන අතර මෙමඟින් පෙනෙන්නේ ළමා මනෝවිද්‍යාව හා ළමා සංවර්ධනය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරිම පැරණි අභයගිරි අධ්‍යාපනයේ වැදගත් ලක්ෂණයක් වූ බව ය. මේ බව සනාථ කරන තවත් ලිපියක් කළුදිය පොකුණෙන් හමු වේ. එහි දක්නට ලැබෙන්නේ සංඝයාගේ කැමැත්ත මත තිසි වයස් සම්පූර්ණ වූවත් ම පැවිදි කළ යුතු බව ය (පරණවිතාන, 1928).

ගිහියන්ට අමතර ව භික්ෂුණීන්වහන්සේලා ද අභයගිරි විහාරයෙහි අධ්‍යාපනය ලබා ඇත. උත්තර, අභය, ශිලා මේඝ, මහින්ද, ජෙට්ඨ යනුවෙන් නම් කළ මෙහෙණවර ගණනාවක් පිළිබඳ ව මහාවංශයෙහි මෙන් ම අභිලේඛනවල ද දැක්වේ (මහාවංසය, 37:45,46,27,28). මහාසේන රජු විසින් කළ අභය හා උත්තර යන මෙහෙණවර ආරාම අභයගිරියට පැවරුණු ඒවා බව ඇතමෙක් පවසති (ගුණවර්ධන, 1993). හත්වන මිහිඳු රජුගේ අභයගිරි සෙල්ලිපියෙහි භික්ෂුණීන්ට දානශාලාවක් ගොඩනැඟු බව කියයි. වත් පොහොසත්කම් අඩුව පැවති මෙහෙණි ආරාම හා ගරාවැටුණු ගොඩනැගිලි පිළිසකර කළ අවස්ථා ද ඇති බව අයෙක් පවසති (වික්‍රමසිංහ, 2004). අභයගිරියට අයත් ව පැවති වෙනත් මෙහෙණවර දෙකක් පිළිබඳ ව සීගිරි ගීවල දැක්වේ (පරණවිතාන, 1956). කණිෂ්ක රජුගේ අනුග්‍රහයෙන් පෙෂවෝ(ර්)හි පැවති සංගායනාවෙන් අනතුරු ව මහායාන ධර්මය දේශ දේශාන්තරවල ව්‍යාප්තවීමත් අභයගිරි භික්ෂූන් දකුණු ඉන්දියාවේ පල්ලවාරාමය සමඟ පැවැත් වූ සබඳතාත් අභයගිරියෙහි විෂයමාලාවට මාහායාන දර්ශනය ඇතුළත් වීමට බල පෑ හේතු ලෙස සැලකිය හැකි ය.

### නොවිධිමත් විෂයමාලාව

අභයගිරි විහාරයෙන් රන් වළලු හා රන් මාල හමු ව ඇති බව කියැවේ. මෙයින් තහවුරුවන්නේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ව පැවති අභයගිරිය රන්භාණ්ඩ නිෂ්පාදනය වැනි අර්ථවත් ක්‍රියාකාරකම්වල යොදවමින් සිසුන්ගේ කාලය ඉතාමත් ප්‍රයෝජනවත් ව ගත වන සේ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල යෙදීමට අවස්ථාව සලසා දී තිබූ බව ය. අභයගිරි විහාරයේ තිබූ ආභරණ පිළිබඳ ව අදහස් දක්වන ඇතමෙක් රන් ආභරණ විහාරරාමයක පැවතියේ මන්ද යන්න විමසිය යුතු බව පවසති (දුනුවිල, 2013).

අභයගිරි විහාරයේ විසූ සෙත්දෙව් නම් තැනැත්තිය විසින් ලියන ලද සීගිරි ගීයක් පිළිබඳ කියයි. එමඟින් අභයගිරි අධ්‍යාපනයේ ගීත නිර්මාණය වැනි විෂය සමගාමී ක්‍රියාවන්ට අවස්ථාවක් තිබූ බව සිතිය හැකි ය (පරණවිතාන, 1956). අභයගිරිය හා සම්බන්ධව ලියැවී ඇති

(09) වන සියවසයට අයත් ශිලා ලිපියක කාව්‍යය භාෂාවක් දක්නට ලැබේ. මෙයින් අභයගිරි වාසිකයන්ට උසස් කාව්‍යය හැකියා තිබූ බව නිගමනය කළ හැකි ය (කුලතුංග, 1996).

අභයගිරිය, ජේතවනය හා මහා විහාරය යන අධ්‍යාපන ආයතනවල සන්නිපාත ශාලා තිබූ බව කියයි. ඒ අනුව, මෙහි විසූ ශිෂ්‍යයන් සමිති සමාගම් කටයුතුවල නිරත වූ බව සිතිය හැකි ය. අභයගිරියෙන් හමු ව ඇති සන්නිපාත ශාලාව දැනට හමු ව ඇති විශාලතම සන්නිපාත ශාලාව බව වික්‍රම ගමගේ (1995) අදහස් කරයි. එකවර විශාල පිරිසකට රැස් ව සමිතිසමාගම් පවත්වන්නට පහසුකම් සකසා තිබූ බව අනුමාන කළ හැකි ය. මුලසිට ම දළදාව භාර ව පැවතියේ අභයගිරියට බව මහාවංශය කියයි (මහාවංසය, 37:92,97). ඒ අනුව, දළදාව හා සබැඳි චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කිරීම මෙහි විසූ ශිෂ්‍යයන් විෂය සමගාමී කටයුත්තක් ලෙස ප්‍රගුණ කරන්නට ඇති බව සිතිය හැකි ය. සේලන්තරමූලය අභයගිරියට අයත් වූවකි. මෙහි විසූවෝ දේව භක්තිකයෝ වූහ. එහෙයින්, මෙම ස්ථානයෙහි දෙවියන් සම්බන්ධ පුද පූජා විෂය සමගාමී කටයුතු ලෙස පවත්වන්නට ඇත. දෙවියන් විසින් අනුමත කළ භික්ෂූන් වහන්සේ නමක් සේලන්තර සමූහයේ ප්‍රධානත්වයට පත් කළ බව මහාවංශය පවසයි (එම).

සිරිසඟබෝ රජුගේ දහතුන් වන (13) රාජ්‍යය වර්ෂයෙහි දී කපාරාරාමයේ සියලු ජනයාගේ පිපාසය දුරු කිරීම සඳහා සංඝනන්දි නම් හිමි නමක් බොන ජලය සඳහා තපුරාන (ටැංකි) දෙසියක් (200) ආර්ය සංඝයාට පූජා කළ බව කුට්ටම් පොකුණ ඇතුළතින් හමුවන සංස්කෘත සෙල්ලිපියක සඳහන් වේ (Ez. Vol.I.P 160-169). මෙයින් පෙනෙන්නේ සමාජ ශුභ සාධන වැඩ මෙම අධ්‍යාපන මධ්‍යස්ථානවල ක්‍රියාත්මක ව පැවති බව ය. එය විෂය සමගාමී ක්‍රියාකාරකම්වල පැවති විවිධත්වයට සාක්ෂ්‍ය සපයන්නකි. මෙයට අමතර ව, වාහදීපක මූලය (වහදු මූල) අභයගිරි විහාරය විෂය බාහිර ක්‍රියාකාරකම්වලට වැදගත් තැනක් දී තිබූ බව තහවුරු කරන ස්ථානයකි (අධිකාරි, 1991).

**අවිධිමත් අධ්‍යාපනය**


අවිධිමත් අධ්‍යාපනය යනු විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනයෙන් පිටස්තර ව සිසුවා ලබන සියලු ඉගෙනුම් අත් දැකීම් වේ. වෙනත් අකාරයකින් පවසතොත්, විධිමත් අධ්‍යාපනයෙන් හා නොවිධිමත් අධ්‍යාපනයෙන් බැහැර ව ලබන ඉගෙනුම් අත්දැකීම් අවිධිමත් අධ්‍යාපනය ලෙස සැලකිය හැකි ය. වර්තමානයේ දී මෙයට සැඟවුණු විෂයමාලාව හා අලිඛිත විෂයමාලාව යන නම් ද ව්‍යවහාර කරයි.

හතරවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි ද පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි ලිපියෙහි ද ජේතවන සංස්කෘත ලිපියෙහි ද නේවාසික පැවිදි සිසුන්ට යහපුරුදු ඇතිකරමින් විනය ගැටලු වළකා ගැනීමට ගත් උත්සාහයයන් ඇතුළත් ව තිබේ. පස්වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියට අනුව පිරිවෙන් ලද්දන් හෙවත් පරිවේණාධිපතිවරුන් නියම කළ දේවල් මිස වෙනත් කිසිවත් අධ්‍යාපන ආයතනවල අයගෙන් හෝ පිටස්තර අයගෙන් නොගත යුතු බව දක්වා ඇත. එවැනි ලබා ගැනීමක් සිදු කළහොත් ඒ පිළිබඳ නඩු ඇසීමක් කොට පිරිවෙනෙන් බැහැර කළ බව කියැවේ. මෙයින් පෙනෙන්නේ අල්ලස් ගැනීම මෙම ආයතනවලින් බැහැර කරමින් ඒ බව අනාගත පරපුරට ආදර්ශමත් ව පෙන්නුම් කළ බව ය. මෙය අවිධිමත් අධ්‍යාපනය ශක්තිමත් වූ අධ්‍යාපන ආයතනයක දැකිය හැකි වැදගත් ලක්ෂණයකි.

ජේතවනාරාම සෙල්ලිපියට අනුව රළු වචන ඇති භික්ෂූන්ට ද, වැරදි ක්‍රියාවල යෙදෙනවුන්ට ද ආයුධ දැරූවන්ට ද අධ්‍යාපන ආයතනවල රැඳී සිටීමට අවකාශ

ලැබී නැත. එවැනි ම අශාසනික පැවැත්මක් ඇති ස්ත්‍රී පෝෂකයන්ට ද, ලෝක වීරෝධී, සාසන විරෝධී ක්‍රියාවන්වල යෙදෙන්නන්ට ද මෙම ආයතන තහනම් භූමි විය. ලාභ ලැබූවන් හා ආවාස ලැබූවන් කළ වරදක් දැනගත්විට ඒ පිළිබඳ නිකායෙහි සංඝයා එක්ව විමසා බැලිය යුතු ය. එම අවස්ථාවේ කිසියම් විසඳුමකට පැමිණිය නොහැකි වුවහොත් සංඝයා හා රාජකීයයන් රැස් ව තීන්දුවක් ගෙන අදාළ පාර්ශ්වයන්ට දඬුවම් කළයුතු බව අනුරාධපුර පුවරු ලිපියේ දැක් වේ (වික්‍රමසිංහ, 2004). පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි ලිපියෙහි කපාරමූලයෙහි පාලනය සම්බන්ධ නීතිරීති දැක්වෙයි (Ez. Vol.1.p 43-46). සඟ මහළු පිළිවෙළට අනුව භික්ෂූනට පැන වූ අසුන් අභයගිරියේ පැවති බව දැක්වේ. එමඟින් වැඩිහිටියන්ට ගරු කිරීම පුරුද්දක් වශයෙන් ප්‍රගුණ කළ අය අභයගිරි අධ්‍යාපන මධ්‍යාස්ථානයෙන් බිහි වූ බව පෙනේ.

**අභයගිරියෙහි පැවති ත්‍රිවිධ විෂයමාලාව**




**නිගමනය**

අභයගිරිය අධ්‍යාපන ආයතනයක් වශයෙන් දියුණු තත්වයකට පත් ව තිබූ බව ඉහත සාකච්ඡා කළ තොරතුරු ඇසුරින් සනාථ වේ. වළගම්බා රාජ සමයෙහි ආරම්භය වූ අභයගිරිය, රාජ්‍යය අනුග්‍රහය යටතේ පොලොන්නරු රාජධානියෙහි චෝල ආක්‍රමණය සිදු වන තෙක් ම මහායාන සම්ප්‍රදාය පෝෂණය කළ විෂයමාලාවකින් යුතු ආයතනයක් ලෙස පැවතී ඇත. මෙහි භික්ෂු, භික්ෂුණී, යන උභතෝ සංඝයා මෙන් ම ගිහි පිරිස් ද අධ්‍යාපනය ලබා ඇත. මෙම භික්ෂු, භික්ෂුණී පිරිස අතර විදේශීය පිරිසක් ද විසූ බව පර්යේෂණ තොරතුරු ඇසුරින්

අනාවරණය විය. ගිහි අධ්‍යාපනයේ දී පිරිවෙනට ඇතුළු කරගත් දරුවන්ගේ වයස සහ ඔවුන් එහි අධ්‍යාපනය ලැබීමට තරම් මානසික මට්ටමක් තිබේ ද යන්න සොයා බැලූ බව ද දක්නට ලැබේ.

විෂයමාලාව විධිමත්, අවිධිමත් හා නොවිධිමත් ලෙස ක්‍රියාත්මක වී ඇත. විධිමත් විෂයමාලාව විෂයන් ගණනාවකින් යුත්ත විණ. ඒවා, භාෂා විෂයන්, කාව්‍යශාස්ත්‍ර, ආගමික විෂයන්, සමයාන්තරඥානය, තාක්ෂණික විෂයන්, කලාත්මක විෂයයන්, ගුප්ත විද්‍යාව, ඉතිහාසය, වෛද්‍යවිද්‍යාව යන ක්‍ෂෙස්ත්‍ර ඔස්සේ උගන්වා ඇත. නොවිධිමත් විෂයමාලාව යටතේ රන් භාණ්ඩ නිෂ්පාදන කලාව හා ගෘහ නිර්මාණ ශිල්ප, කාසි නිෂ්පාදන හා ඒවා භාවිතයට යොමු කිරීම, වහල සෙවිලි කරන උළු නිර්මාණය කිරීම වැනි ක්‍රියාකාරකම් ආශ්‍රිත අත්දැකීම් සිසුනට ලබාදුන් බව දක්නට ලැබේ. මෙයට අමතර ව, ගීත රචනය ද විෂය සමගාමී ක්‍රියාකාරකමක් ලෙස ප්‍රගුණ කරවා ඇත. සමිති සමාගම් හා රැස්වීම් පවත්වමින් අදහස් හා දැනුම හුවමාරු කරගත් බවත් විශාලතම සන්නිපාත ශාලාව අභයගිරිය සතු ව තිබූ බවත් දක්නට ලැබුණි.

දළදා පෙරහැර පැවැත්වීම අභයගිරියට පැවරී තිබූ බවට ලැබෙන සාධක මඟින් තීරණය කළ හැක්කේ විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස ආගමික උත්සව සංවිධානය කිරීම සිසුන් අතර ජනප්‍රිය ව පැවතෙන්නට ඇති බව ය. මෙයට අමතර ව, දේව භක්තියෙන් යුතු ව විසූ පිරිස් ද අභයගිරිය හා අභයගිරිය යටතේ පැවති ආයතනවල විසූ බව කියැවෙන සාධක මඟින් නිගමනය කළ හැක්කේ දේව විශ්වාස ඇසුරින් ගොඩ නැඟුණු ක්‍රියාකාරකම්වල යෙදීමට සිසුන්ට අවස්ථාව ලැබී තිබූ බව ය. කපාරාරාමයේ සිදු කළ ජල ටැංකි පූජාවෙන් තහවුරු කරන්නේ ශුභ සාධන වැඩ සඳහා සිසුන් යොමු කිරීම අභයගිරියෙහි තවත් එක් විෂය සමගාමී ක්‍රියාකාරකමක් වූ බව ය. මේ තොරතුරු මඟින් අනාවරණය වන්නේ ශාස්ත්‍රීය අධ්‍යාපනය පමණක් නො ව සිසුන්ගේ කාලය අර්ථවත් ව ගෙවී යන සේ ඔවුන්ට නිමග්න විය හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් ද ඉතා සංවිධිත ක්‍රමයකට සකස් කොට තිබූ බව ය.

අවධිමත් අධ්‍යාපනය පිළිබඳ අනාවරණය වූ තොරතුරු අනුව නිගමනය කළ හැක්කේ ආයතන පිරියත ඉතා අලංකාරවත් ව සකස් ව තිබූ බව ය. අල්ලස් ගැනීම මෙහි විසූවන්ට ගෝචර වූවක් නො වී ය. බොරු කීම, රළු වචන කීම, අශාසනික පැවතුම් ප්‍රගුණ කිරීම, ලෝක වීරෝධි හා ශාසන විරෝධි ක්‍රියාවල යෙදීම මොවුන් අතින් සිදු ව නැත. එයින් තහවුරු වන්නේ අභයගිරියෙහි අධ්‍යාපනය ලැබූවන් ඉතා උසස් ලෙස මෘදු කුසලතා සංවර්ධනය කරගත් අය බව ය. වරදට දඬුවම් නියම කිරීම නිසා එය දකින අන් අය වැරදි කිරීම්වලට බිය ඇති කරගන්නට ඇති බව නිගමනය කළ හැකි ය. වැඩිහිටියන්ට ගරු කිරීම හා සඟ මහලු පිළිවෙළ අනුගමනය කිරීම මෙම ආයතනවල ප්‍රගුණ කළ බව සැගවුණු විෂයමාලාව හෙවත් අලිඛිත විෂයමාලාව මඟින් මතුවන තොරතුරු සනාථ කරයි.

මෙම සංවිධානාත්මක අධ්‍යාපන ක්‍රියාවලිය නිසා ගොඩ නැඟුණු විධිමත් බව නිසා ම අභයගිරිය දේශීය ව හා විදේශීය ව ජනප්‍රිය අධ්‍යාපන ආයතනයක් බවට පත් ව තිබුණු බව පෙනේ. අභයගිරිකයන් විදේශ සබඳතා පවත්වමින් ඔවුනොවුනගේ ප්‍රගතිය වෙනුවෙන් කටයුතු කොට ඇත.

**මූලාශය**


අධිකාරි, ඒ. (1991) *ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහාසඟ ගණ*, කොළඹ: එස්. ගොඩගේ සහෝදරයෝ.

අමරවංශ, ඒ. සානායක, එච්. (1994) (සංස්), *වංසත්තප්පකාසිනි*, කැලණිය: පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

ආනන්ද, කේ, (2008) *නිකාය සංග්‍රහය*. කොළඹ: සමයවර්ධන.

කුලතුංග, ටී. ජී. (1996) *අභයගිරි පර්යේෂණ*. කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල, රජයේ මුද්‍රණාලය.

ගුණවර්ධන එල්. එච්. (1993) *සිවුර හා නගුල*. කොළඹ: මධ්‍යතන යුගයේ මුල් භාගය තුළ ශ්‍රී ලංකාවේ විහාරස්ථාන, ජීවන සම්ප්‍රදාය හා එහි ආර්ථික පාර්ශවයන් පිළිබඳ අධ්‍යයනය කළ සමාජවිද්‍යාඥයින්ගේ සංගමය.

දුනුවිල, සී, (2013) *අනුරාධපුර යුගයේ අධ්‍යාපන පද්ධතිය*. කොළඹ: ඇස්. ගොඩගේ සහෝදරයෝ.

මහින්ද, යූ, (2018) *ලංකා බෞද්ධ සංස්කෘතිය*, කොළඹ: ඇස්. ගොඩගේ සහෝදරයෝ.

වික්‍රමගමගේ, සී. (1955) *අනුරාධපුර පූජනීය හා රාජකීය ස්ථාන*, දෙහිවල: ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්.

හෙට්ටි ආරච්චි, එස්. බී. සහ කුලතුංග, ටී.ජී. (1996) *අභයගිරි යුනෙස්කෝ ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණය*, අභයගිරි ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

Apsari, Yanuarti. (2018) *Teachers' Problems and Solutions in Implementing Curriculum 2013. Acuity*: Journal of English Language Pedagogy, Literature and Culture, 3, (1), pp. 11-23.

Chandawimala, (n.d.) *The Multifaceted Activities of the Abhayagiri Fraternitiy*, Retrieved from academia.edu/3765538/ The-Multifaceted-Activites-of-the-Abhayagiri-Fraternity.28.06.2024.

Cousins, L.S, (2012) *The Teaching of Abhayagiri Schools. In How Theravada is Theravada? Exploring Buddhist Identities*, (Ed.) Peter Jason A. Carbine, Claudio, c Santi

Degroot, V, (2006) *The Archaelogical Remains of Ratu Boko: From Sri Lankan Buddhism to Hinduism, Indonesia and Malay World*, Traingte, 34 (98), pp 55-74.

Geiger, W. (2007) (Ed). *Mahavamsa*, Asian Educational Services, India.

Jayasuriya, E. (2004) *A Guide to Cultural Tan of Sri Lanka*, Central Cultural Fund.

Kulatunga, T.G, (1996) *Abhayagiri Paryeshana*. Central Cultural Fund. Sri Lanka.

Olamo, Taye Gebremariam, et al., (2019) *Challenges Hindering the Effective Implementation of the Harmonized Modular Curriculum*, The Case of Three Public Universities in thiopia, Creative Education, 10.

McLachlan, Claire, et al, (2018) *Early ildhood Curriculum: Planning, Assessment and Implementation*, Cambridge University Press.

Padmalal, S, (n.d), The Abhayagiri Monastery, Retrieved from: https://www.urlaub-sr-lanka.info/abhayagiri-buddhist-monastery/ 13.06.2024.

Paranawithana, (1956) *Sigri Gratfrit*, London, Oxford University.

Wickramasinghe, C, (2004) *Heritage of Rajarata: Major Natural, Cultural and Historic Sites*, Anuradhapura:Rajarata Development Bank,

Wickramasinghe, D.M, (1904 – 1912) *Epigraphia Zeylannica*, Amen House, Oxford Press: London.